# GMOA

TU No. 291
ESTABLISHED IN 1926

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


**03.09.2011**

**පුවත්පත් නිවේදනය**

**වෛද්‍ය සහ රෝගී ජීවිත අනතුරට හෙළන හම්බන්තොට රෝහලේ ශල්‍යාගාරය**

රෝහල් ශල්‍යාගාරය තුළදී සැත්කම් කිරීමට පෙර රෝගීන් නිර්වින්දනයට භාජනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එහිදී විවිධ නිර්වින්දක වායුන් වර්ග භාවිත කෙරේ. මෙම වායු වර්ග ශල්‍යාගාරයේ පරිසරය තුළට මුසුවීම සිදුවිය හැකි තත්ත්වයක් වන අතර, මෙහි ප්‍රතිවිපාක අවම කර ගැනීම සඳහා, වායු පෙරණයක් සහිත තාක්ෂණික ක්‍රමවේද භාවිත වේ.

එහෙත් අවාසනාවකට මෙන් හම්බන්තොට රෝහල සඳහා ඉහත පහසුකම් සපයා නැත. පසුගිය වසර කිහිපය තුළම මේ සඳහා කරනු ලැබූ පෙන්වා දීම් ඵල රහිත වී ඇති අතර, අදවන විට ශල්‍යාගාරයේ තත්ත්වය ඉතා දරුණු අවදානමකට ලක්වී ඇත.

මේ තත්ත්වය මත ශල්‍යාගාරය තුළ සේවය කරන වෛද්‍යවරුන්ගෙන් 67% කගේම අක්මාව සම්බන්ධ එන්සයිම ක්‍රියාකාරීත්වය (liver functions) අනතුරුදායක ලෙස ඉහළගොස් ඇති අතර ඉදිරියේදී මෙමගින් ඇතිවන දුර්විපාකවලට මුහුණදීමට ඔවුනට සිදුවනු ඇත.

එලෙසම මුලු දිනයක් තුළම මෙම වායුන්ට නිරාවරණය වීම හේතුවෙන් වෛද්‍යවරුන්ට රාජකාරී කාලය තුළ මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට (concentrating ability) අපහසුවීම තුළින් රෝගී ජීවිත ද අනතුරට පත්වීමේ අවදානමක් පවතී.
මෙලෙස වෛද්‍යවරුන්ගේ රැකියාව සම්බන්ධයෙන් අවදානමකට (occupational hazards) ලක්වූ පළමු අවස්ථාව මෙය නොවන අතර මෙවන් අවස්ථාවකදී වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සැකසිය යුතුව ඇත.

මෙම අනතුරුදායක පරිසරය තුළ තවදුරටත් සේවය කිරීම රෝගීන්ට මෙන්ම වෛද්‍ය ජීවිත වලටද දැඩි හානි ඇති කළ හැකි බැවින් හදිසි ප්‍රතිකාර හැර අනෙකුත් සියලුම කටයුතු සඳහා ශල්‍යාගාරය භාවිත කිරීමෙන් වැළකීමට හම්බන්තොට රෝහලේ වෛද්‍යවරු ඒකමතිකව තීරණයකට පැමිණ සිටිති.
ස්තුතියි.

මෙයට විශ්වාසී,

Epitakaduwa

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර -: | වෛද්‍ය ශෙහාන් අයිස් | - | 0777772872 |
| | වෛද්‍ය සංකල්ප මාරසිංහ | - | 0714486770 |